# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.06 28 |
|---|---|---|---|---|---|

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>නිසි නිල මගින් පූර්ව අනුමැතියක් ලබා නොගෙන අත්තනෝමතිකව හා අවිධිමත් ලෙස රාජකාරි කටයුතු සිදු කිරීම</u>**

උක්ත මැයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි නිකුත් කර ඇති, ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/CMA/03/13 හා 2022.06.22 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් විසින් නිසි නිල මගින් කටයුතු නොකරමින්, පළාත් ප්‍රධානීන් මග හැර පූර්ව අනුමැතියකින් තොරව තම අභිමතයට අනුව අත්තනෝමතිකව හා අවිධිමත් ලෙස රාජකරි කටයුතු ඉටු කරන බව ගරු ආණ්ඩුකාරතුමා විසින් නිරීක්ෂණය කර ඇති බව සඳහන් කර ඇත.

03. එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති හා පවතින රැස්වීම් වලදී දෙනු ලබන උපදෙස් ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතු අවස්ථාවන් හිදී අදාල රාජකාරි කටයුතු සිදු කිරීමට පූර්ව අනුමැතියට නිසි නිල මගින් නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් /ආයතන ප්‍රධානීන් ගේ වගකීම බවද අවධාරණය කරමි.

04. එබැවින් මින් ඉදිරියට එවැනි රාජකාරි කටයුතු වලදී පැහැදිලි හා නිශ්චිත නිර්දේශයන් සමඟ නිසි නිල මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත්,එසේ පූර්ව අනුමැතියක් ලබා නොමැති හා ප්‍රමාදව ඉදිරිපත් කරන ඉල්ලීම් ගරු ආණ්ඩුකාරතුමා විසින් කිසිසේත්ම සලකා නොබලන බවත්, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවත්, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධයෙන් ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත - කරු. නිසි නිල මගින් ඉදිරිපත් නොකල ලිපි, විනයානුකූලව කටයුතු කිරීම සඳහා මා වෙත යොමු කිරීමට